# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## බාහිර විභාග අංශය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ද්විතීය පරීක්ෂණය (බාහිර) - 2010**
**2012 ජනවාරි / පෙබරවාරි**

**සමාජීය විද්‍යා පීඨය**

**සංචාරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය - TCRM -E2015**

**සංචරණය සඳහා දෘෂ්‍ය මාධ්‍ය භාවිතය**

**ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. දෘශ්‍ය මාධ්‍ය යනු කුමක්දැයි හඳුන්වා සංචාරණය සඳහා දෘශ්‍ය මාධ්‍ය වැදගත් වන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

02. ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංචාරක කලාප ආශ්‍රිත එක් ස්ථානයක් තෝරාගෙන වාර්තා චිත්‍රපටයක් නිර්මාණය කිරීම සඳහා තිර පිටපතක දළ සැලැස්මක් ඉදිරිපත් කරන්න.

03. විල්පත්තු වනෝද්‍යානය පිළිබඳව සංචාරකයන් දැනුවත් කිරීම සඳහා අත් පත්‍රිකාවක් පිළියෙල කළ යුතුව ඇත. ඒ සඳහා ඔබ විසින් ලබාදෙන යෝජනා මොනවාදැයි පැහැදිලි කරන්න.

04. සංචාරක ව්‍යාපාරය සඳහා අන්තර්ජාලය ප්‍රධාන මූලාශ්‍රයක් ලෙස භාවිත කළ හැකිය. ශ්‍රී ලංකාවේ සුන්දරත්වය පිළිබිඹු වන එක් ස්ථානයක් තෝරාගෙන ඒ පිළිබඳ අන්තර්ජාලයට තොරතුරු මුදාහැරීමට සුදුසු වෙබ් පිටුවක දළ සැලැස්මක් අඳින්න. (මුල් පිටුව පමණක් නිර්මාණය කිරීම ප්‍රමාණවත්ය.)

05. ඩිජිටල් තාක්ෂණයේ ආගමනයත් සමඟ සංචාරක ක්ෂේත්‍රයේ ඇතිවී තිබෙන නව ප්‍රවණතා මොනවාදැයි පැහැදිලි කරන්න.

06. වසර 30 ක පමණ කාලයක් පැවති යුද්ධය අවසන් වීමත් සමඟ ශ්‍රී ලංකාව සංචාරණය සඳහා සුදුසු රටවල් අතරට එක්වී ඇත. ''ශ්‍රී ලංකාව දැන් නිදහස් සාමකාමී රටක්'' යන අර්ථය මතුවන පරිදි නිර්මාණශීලී පෝස්ටරයක් සකස් කරන්න. (දළ සැලැස්ම ප්‍රමාණවත් වේ.)

07. සංචාරක ව්‍යාපාරය උදෙසා නිර්මාණය කරනු ලබන වාර්තා චිත්‍රපටයක තිබිය යුතු මූලික ගුණාංග කවරේදැයි පැහැදිලි කරන්න.

08. පහත සඳහන් මාතෘකා දෙක පිළිබඳව ප්‍රමාණවත් විස්තර සපයන්න.

    1. ඡායාරූප සංස්කරණ මෘදුකාංග
    11. වාර්තා චිත්‍රපටයක නිෂ්පාදන අවධීන්

**සැලකිය යුතුයි**

පහත සඳහන් පැවරුම් මාතෘකා දෙකෙන් එකක් සඳහා ප්‍රමාණවත් පැවරුමක් කරන්න. පරීක්ෂණය අවසාන වී මාසයක කාලයක් ඇතුළත එම පැවරුම ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

1. සංචාරක ව්‍යාපාරය හමුවේ වර්තමාන ශ්‍රී ලාංකීය රූපවාහිනී මාධ්‍යයේ වගකීම පිළිබඳව විමර්ශනය කරන්න.

2. සංචාරක ආකර්ශනය දිනාගැනීම සහ තොරතුරු සන්නිවේදනය සඳහා ශ්‍රී ලංකාවේ නිර්මාණය කරන සඟරා කිහිපයක් තෝරාගෙන ඒවායේ දෘශ්‍ය මාධ්‍ය භාවිතය පිළිබඳ විමසීමක් කරන්න.

**************************